ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1986 අංක 2 දරන පල්ලෙබැද්දේ ශ්‍රී සංඝපාල රජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජනවාරි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 ජනවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 2 දරන පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජනවාරි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 18/85.

පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද එම සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 2 දරන පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජ මහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කෙරෙන) පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාවේ සාමාජිකයන් වූ තැනැත්තන්, නැත හොත්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන) "පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රා වක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සියලු අධිකරණ වල නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට හැකි විය යුතු ය. තවද පොදු මුද්‍රාවක් තබාගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. පල්ලෙබැද්දේ ශ්‍රී සංඛපාල රජමහා විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

ඒ 082474—6,700 (85/03)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී සංඛපාල රජමහා විහාරයේ කාර්ය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම හා ඒ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම ;

(ආ) වෙනත් ප්‍රදේශවල ආරාම සහ බෞද්ධ මධ්‍යස්ථාන ගොඩ නැංවීම ;

(ඇ) ආගමික කටයුතු මෙහෙයවීම ;

(ඈ) ආගමික අධ්‍යාපනය මගින් උවසු උවැසියන්ගේ හා දරු දැරියන්ගේ ආගමික දැනීම දියුණු කිරීම ;

(ඉ) විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ එදිනෙදා අවශ්‍යතා හා අධ්‍යාපන පහසුකම් සැලසීම ; හා

(ඊ) ප්‍රදේශවාසීන්ට හා බාහිර වන්දනාකරුවන්ට ආගමික කට යුතුවල දී ආධාරදීම හා සහායවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් ඇරඹීමට, පවත්වාගෙන යාමට හා අවසන් කිරීමට ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට ද ප්‍රදාන හෝ ත්‍යාග බාර ගැනීමට හෝ එකතු කිරීමට ද තම අරමුදල් ආයෝජනය කිරීමට ද සංස්ථාවේ අරමුණු ක්‍රියාවේ යෙදීම පිණිස අවශ්‍ය සේවක මණ්ඩල බඳවා ගැනීමට, සේවයෙහි යෙදවීමට හා සේවයෙන් පහ කිරීමට ද බලය ඇතුළුව සංස්ථාවේ අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ඉදිරියට ගෙනයාම පිණිස අවශ්‍ය කවර හෝ ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට මේ පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරන ලද නැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත පාලක සභාවක් විසින් සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පළමුවන පාලක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේදී ධුරය දරන සංගමයේ පාලක සභාව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

6. (1) සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකත්වය අවසාන වීම, සංස්ථාවේ වැඩ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කරගැනීම සම්බන්ධයෙන් මේ පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවූ රීති සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසක ඡන්දයෙන් සෑදීම නීත්‍යානුකූල වන්නේය. ඒ රීති, සාදනු ලැබූ කල්හි, එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම, වෙනස් කිරීම හෝ ඒවාට අලුතින් රීති එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය :

එසේ වුවද ඒ රීති වෙනස් කිරීම, ඒවාට අලුතින් රීති එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම පාලක සභාව විසින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයන් තත්කාලයෙහි වලංගුව පවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට ලැබිය යුතු ණය.**

7. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු ය. තවද, සංගමයට ලැබිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.**

8. සංස්ථාවට මිළදී ගැනීමකින්, ප්‍රදානය කිරීමකින්, ත්‍යාග කිරීමකින්, අන්තිම කැමැති පත්‍රයක් මගින් වූ නියාදනයකින් හෝ අන්‍යාකාරයෙන් සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් ලබාගැනීමට හෝ දැරීමට ද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීමට ද නීත්‍යානුකූල ශක්‍යතාව ඇත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව තබන ආකාරය.**

9. සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට තැබීම, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එහි අත්සන් කළ යුතු සංස්ථාවේ සභාපති හා ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී ම සිය යුතු ය. තවද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවන වශයෙන් යමකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.